# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2363/15 – 2023 දෙසැම්බර් මස 19 වැනි අඟහරුවාදා – 2023.12.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2018/209.

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2021.02.05 දිනැති හා අංක 2213/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.01.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. අතුරුගිරිය, ශාන්තාලෝකගම, නව නිවාස සංකීර්ණය, අංක 46 හි පදිංචි රොෂාන් ඥාණප්‍රිය අගම්පොඩි මයා, 2. කඩුවෙල, කොතලාවල, පට්ටියාවත්ත පාර, ෆැෂන් ගාඩ්න්, අංක 213/1 හි පදිංචි ඒ. එම්. කේ. බී. අතාවුද මයා, 3. මාලඹේ, තලාහේන, තුෂාර මාවත, අංක 46/1ඒ. හි පදිංචි පී. එම් ආනන්ද කරුණාරත්න මයා සහ බත්තරමුල්ල, සෙත්සිරිපාය, 9 වන මහල ලිපිනයෙහි පිහිටි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/14/2021 හා 2023.11.17 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 දෙසැම්බර් මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 41045 – 13 (2023/12)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කිරීමේ අංශයේ දී**

ගොනු අංකය*:* IR/COM/04/2018/209.

බේරුම්කරණ අංකය*:* A/14/2021.

පාර්ශ්වකරුවන් *:*

1. රොෂාන් ඥාණප්‍රිය අගම්පොඩි මයා.
අංක 46, නව නිවාස සංකීර්ණය, ශාන්තාලෝකගම, අතුරුගිරිය.

2. ඒ. එම්. කේ. බී. අතාවුද මයා.
අංක 213/1, ෆැෂන් ගාඩ්න්, පට්ටියාවත්ත පාර, කොතලාවල, කඩුවෙල.

3. පී. එම්. ආනන්ද කරුණාරත්න මයා
අංක 46/1, ඒ. තුෂාර මාවත, තලාහේන, මාළඹේ.

*පළමු පාර්ශ්වය*

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය,
09 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල

*දෙවන පාර්ශ්වය*

කම්කරු අමාත්‍ය, නිමල් සිරිපාල ද සිල්වා මහතා වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරි ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කර එය මා වෙත යොමු කර ඇත.

ආරාවුලට හේතු වී පවත්නා කරුණු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂවරුන් වශයෙන් සේවය කළ රොෂාන් ඥාණප්‍රිය අගම්පොඩි, ඒ. එම්. කේ. බී. අතාවුද මයා, සහ රියදුරු වශයෙන් සේවය කරන ලද පී. එම්. ආනන්ද කරුණාරත්න යන සේවකයන් සම්බන්ධයෙන් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය අනුගමනය කර ඇති විනය ක්‍රියාමාර්ග හා ලබා ඇති දඬුවම් මගින් ඔවුන්ට අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

මෙම කාර්මික ආරවුලට හේතු වී ඇති කරුණු සම්බන්ධයෙන් පළමු පාර්ශ්වය විසින් ඇමුණුම් 1 සිට ඇමුණුම් 39 දක්වා සලකුණු කරන ලද ලේඛනද, දෙවන පාර්ශ්වයේ පළමු ප්‍රකාශයද, පළමු පාර්ශ්වයේ පිළිතුරු ප්‍රකාශයද ඉදිරිපත් කොට ඇත.

මෙම ආරාවුල විභාගයට නියම කරන ලද අවස්ථාවේදී දෙපාර්ශ්වය විසින් පිළිගැනීම් සහ විසඳනා ඉදිරිපත් කොට ඇත.

ඒ අනුව පළමුවන පාර්ශ්වයේ පිළිගැනීම් වශයෙන් වර්ෂ 2017.18.25 දින සිට 2019.07.14 දින දක්වා හිඟ වැටුප් ගෙවා ඇති බව 2019.07.15 දින නැවත සේවය ලබා දී ඇති බවත්, හිඟ වැටුප් සඳහා වැටුප් වර්ධක හිමි වී ඇති බවත්, ඉල්ලුම්කරු දරමින් සිටි තනතුරේ ශ්‍රේණිය උසස් කිරීමක් පමණක් සිදු වී ඇති බවත් ඉල්ලුම්කාර පාර්ශ්වය (පළමු පාර්ශ්වය) පිළිගෙන ඇත.

පළමු පාර්ශ්වයේ (පළමු ඉල්ලුම්කරු) විසදනාවන් වූයේ පළමුවන ඉල්ලුම්කරුවන් වෙනුවෙන්

1 සේවය පිහිටුවා තිබූ කාලය තුළ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ සඳහා උසස්වීම් සඳහා අවස්ථාවක් ලැබී නොමැත්තේ ද?

2 ඒ හේතුකොටගෙන ඔවුන්ට ලබාගැනීමට තිබූ උසස්වීම අවස්තාවන් මගහැරි ඇත්තේ ද?

3 ඒසේ මගහැරීම හේතුකොටගෙන පළමුවන හා දෙවන ඉල්ලුම්කරුවන්ට හානියක් සිදු වී ඇත්තේ ද?

4 එසේ හානියක් සිදු වී ඇත්තේනම් එක් එක් අයට වෙන් වෙන් වශයෙන් සිදු වූ මූල්‍යමය හානිය කොපමණ මුදලක් වන්නේ ද?

5 දිසානායක කමිටු වාර්තාවේ පුද්ගලික ලිපිගොනුවේ චෝදනා පත්‍ර ඉවත්කර ගැනීමට යෝජනා වී ඇති ද?

6 චෝදනා පත්‍ර ඉවත් කර නොගැනීම සම්බන්ධ ඉල්ලුම්කරුවන්ගේ ඊකියාව සම්බන්ධයෙන් අනාගතයේදී යම් අවධානමක් ඇත්තේ ද?

වගඋත්තරකාර පාර්ශ්වයේ විසදිය යුතු ප්‍රශ්න වන්නේ

1 පළමුවන ඉල්ලුම්කරු සේවය තහනම්කළ කාල සීමාවේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලබා ගත නොහැකි වූ සමාජ සජීවීකරණ අධ්‍යක්ෂ තනතුරට උසස් නොකළ යුතු වන්නේ ද?

2 පළමුවන ඉල්ලුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඔහුට එරෙහිව ඇති චෝදනා පත්‍රය ඉවත් නොකළ යුතු වන්නේ ද?

3 පළමුවන ඉල්ලුම්කරු පළමු අවස්ථාවේදී වරද පිළිගන්නේ ද? ලෙසත්ය.

දෙවන ඉල්ලුම්කරුගේ විසදනාවන් වූයේ

1 දෙවන ඉල්ලුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇතුලත් කර ඇති චෝදනා පත්‍රය ඉවත් නොකළ යුතු වන්නේ ද?

2 දෙවන ඉල්ලුම්කරු වැඩ තහනමට ලක් කළ අවස්ථාවේදී මුදල් තනතුර අධ්‍යක්ෂ මුදල් තනතුර ආවරණය කරමින් සිටියේ ද?

3 එම තනතුරට අයත් වැටුප් ලබාදිය යුතු නොවන්නේ ද?

ඉල්ලුම්කාර පාර්ශ්වයේ විසදනාවන් වූයේ

1 පිළිගැනීම් වල සඳහන් පරිදි මුල් අවස්ථාවේදී එක සහ තුන සේවකයන් සදහා චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර ඇත්තේ ද?

2 ඒ සම්බන්ධව නිදහසට කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව නැවත සේවයේ පිහිටුවා ඇත්තේ ද?

3 එසේ නැවත සේවය පිහිටුවීමෙන් පසුව සංශෝධිත චෝදනා පත්‍රයක් ලබා දී සේවයේ අත්හිටුවීම සාධාරණ හා යුක්තිසහගත වන්නේ ද? වශයෙන් ඉදිරි පත්කොට ඇත.

ඉහත කී පිළිගැනීම් හා විසදනා සටහන් කිරීමෙන් පසු නඩුවෙහි විභාගය ආරම්භ කර ඇත.

එසේ වුවද මෙම නඩු විභාගය ආරම්භ කිරීමට මත්තෙන් පළමු පාර්ශ්වයේ තුන්වන ඉල්ලුම්කරු වන පී. එම්. ආනන්ද කරුණාරත්න යන අය මෙම ඉල්ලුම්පත්‍රය මගින් ඉල්ලා ඇති සහන නොඉල්ලා සිටින බවටත් මෙම නඩු කටයුත්තෙන් ඉවත්වීමට අවශ්‍ය බවට ඉල්ලීමක් කර ඇති බැවින් ඔහු මෙම නඩුවෙන් ඉවත්කර ඇත.

ඒ අනුව මෙම නඩුවේදී මෙම අධිකරණය විසින් සලකා බැලි යුතු වන්නේ පළමු හා දෙවන ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් පමණක් වේ. නඩු විභාගය ආරම්භ කරමින් පළමුවන පාර්ශ්වයේ පළමු ඉල්ලුම්කාර රොෂාන් ඥානප්‍රිය අගංපොඩි තම මූලික සාක්ෂිය දිව්රුම් ප්‍රකාශ මගින් ලබා දී ඇති අතර, රොෂාන් ඥානප්‍රිය අගංපොඩි යන අය දිව්රුම් ප්‍රකාශ ගොනු කරමින් X1 ලෙස නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ තෝරාගැනීමේ ලිපිය X2 ලෙසත් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි සහතිකය X3 ලෙසත්, රුහුණු විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි සහතිකය ලකුණුකොට ඉදිරිපත් කොට ඇත.

මෙම නඩුවේ නඩු විභාගය ආරම්භකොට ඉල්ලුම්කාර පාර්ශ්වයේ පළමු ඉල්ලුම්කරු සාක්ෂියට කැදවා මූලික සාක්ෂිවල X1 ලෙස X4 දක්වා ලේඛන නැවත X1-A1, X2-A3, X3-A2, ලෙස නැවත ලකුණු කරමි A1 සිට A4 ලෙස පිටු තුනකින් සමන්විත මූල්‍යමය අලාභය ගණනය කරන ලේඛන ලකුණුකොට ඇත. එකි ලේඛන ඔප්පු කිරීමේ භාරයට පත්කොට ඇත. එම ලේඛන ප්‍රකාරව පළමු ඉල්ලුම්කරු තමන්ට අහිමි වූවායැයි කියන මුදල රුපියල් තිස් හත් ලක්ෂ තිස් හතර දහස් නවසිය හැට හත (3,734,967/-)ක් බව ප්‍රකාශ කර සිටි. ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටියේ තමන් වගඋත්තරකාර ආයතනයේ දත්ත පදනම් කරගනිමින් එම තනතුරු වලට හිමි වැටුප් හා දීමනා පදනම්කොට මෙම A4 දරන ලේඛන සකස් කර ඇති බවත් ය.

පළමුවන ඉල්ලුම්කරු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ප්‍රකාශ කොට ඇත්තේ දැනට නියෝජ්‍ය අධ්‍යක්ෂ පරිපාලන ලෙස කටයුතු කර ඇතත් අධ්‍යක්ෂ සමාජ සජීවීකරණ තනතුරට සමාන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමට උසස් වීමක් ලබා දෙන ලෙසටත් වේ.

තවද පාර්ශ්වයන් පිළිගෙන ඇති ආකාරයට සාක්ෂි විශ්ලේෂණයේදී පෙනී යන්නේ ඉල්ලුම්කරුට මූලික වශයෙන්ම මෙම ආරාවුල මගින් විසදිය යුතු වන්නේ,

1 A1 ලෙස ලකුණු කර ඉල්ලුම් පත්‍රය දැන්වීම්ගතකරණ අවස්ථාව වන විට ඉල්ලුම්කරුවන් සේවයෙහි අත්හිටුවා තිබීම හේතුකොටගෙන ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර නිසි පරිදි ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබී නැද්ද යන්නත්

2 අදාළ ඉල්ලුම්පත්‍රයේ සඳහන් මූලික සුදුසුකම් එම අවසාථාවේදී පළමු ඉල්ලුම්කරුට පැවත ඇත්තේ ද යන්නත්

3 අදාළ තනතුරට ඉල්ලුම්පත් කැඳවීමෙන් බඳවා ගෙන ඇති තැනැත්තා හෝ තැනැත්තිය මෙම ඉල්ලුම්කරුට පවත්නා සුදුසුකම්වලට වඩා සුදුසුකම් ඇති තැනැත්තෙකුද යන්න මත පළමු ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධව සාධාරණ හා යුක්ති සහගත තීන්දුවක් සලකා බැලීමට මෙම බේරුම්කරණයට හැකියාව පවතින බව තහවුරු වේ.

දෙවන පාර්ශ්වය විසින් R1 සිට R13 දක්වා ලේඛන ලකුණුකොට ඇත.

ඒ අනුව මෙම ඉල්ලුම්කරුගේ අධ්‍යක්ෂ සමාජ සජීවිකරණ තනතුරට බඳවාගැනීම R11B ලෙස ලකුණු කර ඇතත් එය ඉල්ලුම්පත්‍රයේ A1 දරන දැන්වීම ප්‍රකාරව වේ.

අධ්‍යක්ෂ (සමාජ සජීවිකරණ) තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුව 01 වන පාර්ශ්වයේ 01 වන ඉල්ලුම්කරු එම තනතුරට පත්කිරීම සඳහා සුදුසුකම් තිබේ ද?

දෙවන පාර්ශ්වය විසින් R11b ලෙස ලකුනු කරන ලද අධ්‍යක්ෂ (සමාජ සජීවිකරණ) තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුව බාහිර අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම් යටතේ,

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සමාජ විද්‍යාව විෂයක් ලෙස ඇතුළත් අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ලබාගත් ප්‍රථම උපාධියක් සමග,

2. අදාළ විෂය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ

3. රජයේ රාජ්‍ය සංස්ථාවක, මාණ්ඩලික, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්ද.

පළමු ඉල්ලුම්කරු මූලික සාක්ෂි හා හරස් ප්‍රශ්න වලදී ඉල්ලුම්කරුගේ ප්‍රථම උපාධිය ශාස්ත්‍රවේදි උපාධියක් සහ එහි සමාජ විද්‍යා විෂයයන් සඳහන් නොවන බවත් ය.

තම උපාධියට හදාරා ඇති උපාධිය සමාජ විද්‍යා විෂයයට අදාළව හෝ තමා අධ්‍යනය කර ඇති විෂය කුමක්ද යන්න තහවුරු කර නොමැති බවත්, එසේම ඉල්ලුම්කරුගේ A3 දරන පශ්චාත් උපාධිය ද, A1 ලෙස ඉල්ලා සිටින සුදුසුකමක් ලෙස පෙන්වා නැත.

එය ඉල්ලුම්කරන තමාට අදාළ ඉල්ලුම්පත්‍රයේ සඳහන් පරිදි කළමනාකරණ මට්ටමක අවම වසර 15 ක පළපුරුද්ද යන්න සඳහන් වේ.

ඉල්ලුම්කරු විසින් එකී කරුණ ඔප්පු කිරීම සඳහා කිසිඳු ලේඛනයක් ඉදිරිපත් කර නොමැත.

සාක්ෂිකරු ප්‍රකාශ කොට ඇත්තේ සමාජ සජීවිකරණ අධ්‍යක්ෂ තනතුරට අදාළ චක්‍රලේඛන පිළිබඳ තමාට අවබෝධයක් ඇති බවත්, 2018.12.07 දින කළමනාකරණ චක්‍රලේඛ අංක 30 විධිවිධාන අනුව R11 ලෙස ලකුණු කර ඇති ලේඛනය සහ R11A, R11B ලේඛන ලකුණු කර ඇත. R11B ලේඛන සැසඳීමේදී ඉල්ලුම්පත්‍රය සමග ගොනු කර ඇති A1 ලේඛනයේ සුදුසුකම් ලෙස තහවුරු වේ.

තවද ඉල්ලුම්කරු විසින් තමන් වසර 15 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති දිවුරුම් ප්‍රකාශය මගින් ලකුණුකර ඇති නමුදු වාචික ලේඛන මත හෝ මූලික සාක්ෂිවලදී පිළිතුරු ලබා දී නොමැත.

කෙසේ වුවද ඉල්ලුම්කරු විසින් වර්ෂ 2005 සිට 2007 දක්වා වසර දෙකකට ආසන්න කාලයක් ග්‍රැෆික් නිර්මාණකරුවකු ලෙස සේවය කළ බවත් දක්වා ඇත. ඔහු ප්‍රථම උපාධිය සිදුකරනු ලැබුවේ 2005.09.23 වන දීය.

අදාළ රැකියාව කළමනාකරණ මට්ටමේ තනතුරක් හෝ සමාජ විද්‍යාත්මක තනතුරක් නොවන බවට පැහැදිළි වේ.

ඉල්ලුම්කරු 2011.05.15 දින ආයතනයේ පරිපාලන නිලධාරි තනතුර සඳහා ඉදිරිපත් කළ ලේඛනවල හෝ අවුරුදු 15 ක කළමනාකරණ මට්ටමේ රැකියාවක නිරත වූ බව තහවුරු කිරීමට අපොහොසත් වී ඇත. ඒ අනුව බේරුම්කරණයේදී නිරීක්ෂණය වන්නේ ඉල්ලුම්කරු ඉල්ලුම්පත්‍රය යොමුකරන කාලය තුළ සක්‍රීය සේවයේ සිටියදී ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති A1 දරන ලේඛනය ප්‍රකාරව ද, රැකියාවෙහි අවශ්‍යතාවයන් තෘප්ත කිරීමට හැකියාවක් නොලැබෙන බවයි.

මෙම නඩුවේදී පළමුවන ඉල්ලුම්කරු විසින් බේරුම්කරණයට වසර 15 වසරක රැකියාවක නියුතුවීම සම්බන්ධව සාධක ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇත.

ඒ අනුව ඉල්ලුම්කරු බාහිර අයදුම්කරුවකු ලෙස ඉල්ලුම්පත්‍ර ගොනු කළද, එකී රැකියාවෙහි මූලික සුදුසුකම් සපුරා නොමැති බැවින් මෙම අධ්‍යක්ෂ (සමාජ සජීවිකරණ) පත්වීමට අවස්ථාවක් නොමැති බවට පැහැදිලි වේ. ඉන්පසු බේරුම්කරණය අවධානය යොමු කරණු ලබන්නේ සමාජ සජීවිකරණ අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගෙන ඇති තැනැත්තා හෝ තැනැත්තියගේ සුදුසුකම් හා අනෙකුත් කරුණු වේ.

තවද අදාළ තනතුරට බඳවා ගැනීමේ පටිපාටිය අනුව අභ්‍යන්තර අයදුම්කරුවෙකු මෙම තනතුරට අයදුම් කිරීම සඳහා සුදුසුකම් නොමැති බව ඉල්ලුම්කරු විසින්ම පිළිගෙන ඇත. ඊට පැහැදිලි කිරීමක් ලෙස දක්වා ඇත්තේ 2019.12.19 වන දිනය වන විට MM-1/1 ශ්‍රේණියේ වසර 5 ක සුදුසුකම් සපුරා නොමැති බව පිළිගෙන ඇත. ඒ බව නීති නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩී. ඒ. ඩී. දිසානායක මහතාගේ සාක්ෂියෙන් ද තහවුරු කොට ඇත.

දෙවන පාර්ශ්වය විසින් R17ඒ ලෙස ලකුණු කර ඇති ලේඛනය ප්‍රකාරව අධ්‍යක්ෂ සමාජ සජීවිකරණ තනතුර සඳහා බඳවාගෙන ඇති තැනැත්තියගේ සුදුසුකම් ලෙස ප්‍රථම උපාධිය ලෙස සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් හා ප්‍රාදේශීය සංවර්ධනය සහ සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති බවත්, 1997 සිට 2005 දක්වා World view International Foundation (WIF) ව්‍යාපෘති කළමණාකාරියක ලෙස වසර 8 ක කාලයක් සේවය කළ බවත්, වර්ෂ 2006 ජනවාරි සිට 2010 අගෝස්තු දක්වා සංවර්ධනය සඳහා වන සහන පදනමේ ව්‍යාපෘති කළමණාකාරියක ලෙස වසර 4ක සේවයක් සිදු කර ඇති බවත්, වර්ෂ 2016.04.18 සිට 2019 දක්වා NSBM ආයතනයේ සහකාර ව්‍යාපෘති කළමණාකාරියක ලෙස සේවය කර ඇති බව දක්වා ඇත.

තවද 2010.09.01 දින සිට වසරක කොන්ත්‍රාත් කාලයක් සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ උපදේශක ලෙස ද, වර්ෂ 2011.09.01 සිට තවත් වසරක කොන්ත්‍රාත් පදනම මත ද අමාත්‍යාංශ උපදේශක තනතුරක් දරා ඇති බවට ලේඛන ගොනුකර ඇත. මෙම කිසිඳු ලේඛනයක් ඔප්පු කිරීමේ භාරයට යටත් කොට නොමැති බවත් අදාළ ලේඛන ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් නැවත හරස් ප්‍රශ්න මගින් හබකර සිටීමක් ද කර නොමැත. ඒ අනුව තව ද එසේ පත්කර ඇති නිලධාරියාට වඩා වැඩි සුදුසුකම් සහිත නිලධාරියෙකු බැහැර කර ඇති බවට සාක්ෂි මගින් තහවුරු වීමක්ද සිදු නොවේ. ඒ අනුව පළමුවන ඉල්ලුම්කරුගේ මූලික ඉල්ලීම සම්බන්ධව මෙම බේරුම්කරණයේ මතය වන්නේ දැනට මෙම ආයතනයට බඳවාගෙන ඇති තැනැත්තිය මෙම නඩුවේ ඉල්ලුම්කාර තැනැත්තාට වඩා සුදුසුකම් වලින් පරිපූර්ණ තැනැත්තෙකු බවත්, ඉල්ලුම්කරු ඉල්ලා සිටින ආකාරයට වැටුප් තලයේ ඉල්ලීම හෝ වෙනත් සහන ලබාගැනීමට හැකියාවක් නොමැති බවත් ය.

එසේ වුවද ජයතිලක දිසානායක වාර්තාව පදනම් කරගෙන මේ වන විට හිඟ වැටුප්, වේතන හා වෙනත් සහන ලබාදී ඇති අතර ආයතනික මට්ටමෙන් ඉල්ලුම්කරුවන්ට හිමිවන මීලඟ උසස්වීම ලබා දී ඇති බව තහවුරු වේ. මෙම කරුණු සලකා බැලීමේදී ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුවේ චෝදනා පත්‍රයක් පැවතීම උසස්වීම් හා අනෙකුත් කටයුතු සඳහා බාධාවක් වී නොමැති බව තහවුරු වුවත් ඉල්ලුම්කරු සම්බන්ධයෙන් ආයතනය විසින් කලින් කලට අධ්‍යක්ෂ මණ්ඩල වෙනස් කිරීම සිදු කරන අවස්ථාවේ දී වෙනත් චෝදනා පත්‍ර කිහිපයක්ම ලබාදීම තුළ අදාළ ලේඛනය මුල් උපගොනුවේ පැවතීම අසාධාරණයක් විය හැකි බව නිගමනය කරමි. ඒ අනුව ඉල්ලුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවෙන් දැනට ඉදිරිපත් කොට ඇති චෝදනා පත්‍ර ඉවත් කිරීම සාධාරණ බවට තීරණය කරමි.

දෙවන ඉල්ලුම්කරු ඒ.එම්.බී.අතාවුද විසින්

මෙම නඩුවට අදාළව මූලික සාක්ෂි දිවුරුම් පෙත්සමක් මගින් ලබා දී ඇති අතර ඔහු විසින් X1 සිට X5 දක්වා ලේඛන ලකුණු කර ඇත.

I. මෙම ඉල්ලීමට අදාළ මූලික සුදුසුකම් අධ්‍යක්ෂ මුදල් HM 1/1 2016 යටතේ ගණකාධිකරණ හා මූල්‍ය ක්ෂේත්‍රයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණ/මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ උපාධියක් ලබාතිබීම හෝ

II. පිළිගත් ICA/CIMA /ACCA ආශ්‍රිත සාමාජිකත්වය ලබාතිබීම හෝ

III. සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ (CMA)වෘත්තීය සාමාජිකත්වය ලබා තිබීම.

IV. උපාධිය ලබාගැනීමෙන් පසු/වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසු රජය හෝ රාජ්‍ය ආයතනයක රජය පිළිගත් ආයතනයක ගිණුම් කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක් තිබිය යුතු බව දන්වා ඇත.

ඒ අනුව A1 හා R23 වශයෙන් දක්වා ඇති පුවත්පත් දැන්වීම් අනුව 2007.11.01 දින ව්‍යාපාර පරිපාලක ප්‍රථම උපාධිය හා පශ්චාත් උපාධිය හා ශාස්ත්‍රපති උපාධිය 2014.01.01 දින ලබාගෙන ඇත.ඒ අනුව මූලික අධ්‍යාපන සුදුසුකම් අයදුම් පත්‍ර අ ඡේදය ප්‍රකාරව 2 වන ඉල්ලුම්කරු තෘප්ත කර ඇත. තවද අවුරුදු දෙකක් එනම් වර්ෂ 2008.11.18 සිට 2011.11.01 දක්වා අවුරුදු 2යි මාස 2 ක කාලයක් ද 2012.06.01 දින සිට 2017.07.03 දින දක්වා වසර 05 ක සේවා කාලයක් ද සපුරා ඇත. ඒ අනුව ඉල්ලුම්කරු ඉල්ලුම් පත්‍රයේ සඳහන් පරිදි අදාළ දින වන විට සම්පූර්ණ කර ඇති සේවා කාලය අවු. 7 යි මාස 2 ක කාලයක් ද එම කාලය වසර 10 ක සම්පූර්ණ කර නොමැති බවටත්, දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති තර්කය බිඳ හෙළීමට ඉල්ලුම්කරු අසමත් වී ඇත. තවද R25 ලේඛනය ප්‍රකාරව අභ්‍යන්තර අයදුම්කරුවකු වශයෙන් සුදුසුකම් ලබාගැනීමට නම් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කළමණාකාර සේවා ගණයේ සංවර්ධන අධිකාරියේ MM 1-1 වැටුප් ප්‍රමාණයේ 1 ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ (සහකාර අධ්‍යක්ෂ/ මුදල් හෝ සහකාර අධ්‍යක්ෂ ප්‍රසම්පාදන ගෙවීම්) වසර 05ක සේවා කාලයක් තිබිය යුතු වේ.

නමුත් සාක්ෂි අනුව පැහැදිළි වන්නේ MM 1-1 වැටුප් ප්‍රමාණයේ 1 ශ්‍රේණියේ තනතුරක් මෙම ආයතනයේ ඇතිකර නොමැති බැවින් ආයතනයේ කිසිදු තැනැත්තෙකුට අභ්‍යන්තර කෙනෙකු වශයෙන් ඉල්ලුම් කිරීමට හැකියාවක් නොමැති බවත්ය.

ඒ අනුව මෙම ඉල්ලුම්පත්‍රය සමග ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති x4 දරන ලේඛනය තුලින්ද ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය අනුව සම්මුඛ පරීක්ෂණයට නොකැඳවීමට අදළව කරුණු පැහැදිලි කිරීමක් සිදුකොට ඇත.

ඒ අනුව ඉල්ලුම්කරුට අදාළ කාල සීමාව තුළ සේවය අත්හිටුවා තිබීම තුල කිසිඳු අසාධාරණයක් හෝ අයිතියක් මෙම ඉල්ලුම්පත්‍ර ගොනු කිරීමේදී කිසිඳු අසාධාරණයක් හෝ අයුක්තියක් සිදු වූ බවට තහවුරු කිරීමට ඉල්ලුම්කරු අපොහොසත් වී ඇත. ඒ අනුව දෙවන ඉල්ලුම්කරුගේ විසදනාවන්හි සඳහන් පරිදි 02, 03 විසඳනාවයන් අදාළ නොවේ.

දෙවන ඉල්ලුම්කරුගේ ඉල්ලුම්පත්‍රයේ චෝදනා පත්‍රය පෞද්ගලික ලිපිගොනුවෙන් ඉවත් කිරීම සම්බන්ධව විසදනාවක් යොමු කොට ඇත.

මෙම නඩුවට අදාළව ඉල්ලුම්කරුවන්ට අවස්ථා කිහිපයකදීම චෝදනා පත්‍ර ගොනුකොට ඇත.

එසේ වුව ද වැඩ තහනමට ලක්ව සිටි කාලය තුළ හිඟ වැටුප් හා විලම්බිත වැටුප් වර්ධක සියල්ල ලබාදී ඇති අතර දෙවන පාර්ශ්වය විසින් නම්කර ඩී. එම්. ජයතිලක දිසානායක පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ හා නිගමන අනුව අදාළ කටයුතු සිදු වූ බව පෙනීයයි. දෙවන පාර්ශ්වය ප්‍රකාශ කරන පරිදි අදළ චෝදනා පත්‍රය පෞද්ගලික ලිපි ගොනුවේ තිබියදී ඊළඟ උසස්වීම් තලයට යොමුකොට ඇත. එසේ වුවද අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇති ආකාරය විටින් විට පත්කල අධ්‍යක්ෂ මණ්ඩලය ගෙන ඇති තීන්දු හා අදාළ චෝදනා පත්‍ර පෞද්ගලික ලිපි ගොනුවේ පැවතීම ඉල්ලුම්කරුවන්ට අසාධාරණයක් සිදු වී ඇති බව දිසානායක කමිටු වාර්තාවෙන් ද මෙම ආරාවුලේ සියලු සාක්ෂි හා කරුණු අනුව ද අදාළ ලේඛන පෞද්ගලික ලිපි ගොනුවෙන් ඉවත්කිරීම සම්බන්ධයෙන් ඇති ඉල්ලීම ප්‍රදනය කරමි.

ඒ අනුව ඉල්ලුම්කරුවන්ගේ මූලික ඉල්ලීම්වල සේවා තහනමට ලක්ව ඇති අවස්ථාව හේතුකොට ගෙන ඔවුන්ට ඉල්ලුම්කිරීමට හැකියාව නොලැබීමෙන් අසාධාරණයක් සිදුවී නොමැති බවත් වගඋත්තරකාර පාර්ශ්වය විසින් ආයතනයට ලබාගත් බාහිර අයදුම්කරුවන් පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන්ට වඩා සුදුසුකම් ඇති පුද්ගලයන් බඳවාගෙන ඇති බවත්, ඒ හේතුකොටගෙන ඉල්ලා ඇති පරිදි සමාන වැටුප් තලයක පිහිටුවීම හා අලාභ මුදලක් ගෙවීම අවශ්‍ය නොවන බවට තීරණය කරමි. ඒ අනුව මෙම ප්‍රදනය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

## ප්‍රදානය

මෙම බේරුම්කරණ ආරාවුලට අදාළ බේරුම්කරණ ප්‍රදනයක් ලබාදීමේදී 1, 2 ඉල්ලුම්කරුවන් ප්‍රකාශ කරන පරිදි ඔවුන්ගේ වැඩ තහනම් කිරීම හේතුකොටගෙන 01 වන ඉල්ලුම්කරුට අධ්‍යක්ෂ සමාජ සජීවිකරණ සහ 02 වන ඉල්ලුම්කරුට අධ්‍යක්ෂ මුදල් තනතුරු සඳහා ඉල්ලුම්පත් භාරගෙන සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වුවද 01, 02 ඉල්ලුම්කරුවන් එකී තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීම මත එකී තනතුරු හිමිවීමට අවකාශයක් හිමි නොවන බැවින් ද, තෝරාගත් ඉල්ලුම්කරුවන් නිසි සුදුසුකම් සපුරා ඇති බැවින් ද ඉල්ලුම්කරුවන් සඳහන් කරන ආකාරයට තනතුරු වලට අදාළ වැටුප් තලයන්, වැටුප් පියවරයන් සහ වාර්ෂික වැටුප් වර්ධකයන් සහ ඊට අදල අනෙකුත් වරප්‍රසාද සහ දීමනාවන් ලබාදීමේ අවශ්‍යතාවයන් පැන නොනගින බැවින් 01, 02 ඉල්ලුම්කරුවන්ගේ එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

එසේ වුවද ජයතිලක දිසානායක කමිටු වාර්තාවේ නිර්දේශයන්ට යටත්ව ඉල්ලුම්කරුවන්ට සේවය අත්හිටවූ කාල සීමාව තුළ සියලු දීමනා, හිඟ වැටුප් සහ ආයතනික උසස්වීම් නිසි පරිදි ලබා දී ඇති බැවින් 01, 02 ඉල්ලුම්කරුවන්ගේ පෞද්ගලික ලිපි ගොනුවල ඔවුන්ට විරුද්ධව ඇති චෝදනා පත්‍ර ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමට ඉඩ ලබාදිය යුතු බවට තීරණය කරන බැවින් 01, 02 ඉල්ලුම්කරුවන්ගේ පෞද්ගලික ලිපි ගොනුවල ඇති චෝදනා පත්‍ර ඉවත් කරන ලෙසට දෙවන පාර්ශ්වයට නියම කරමි.

ඒ බව මෙය ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත සහකාර කම්කරු කොමසාරිස් නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත ලිඛිතව දන්වා සිටින ලෙසට නියම කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

නීතිඥ ධම්මික එන්. අපෝන්සු,
බේරුම්කරු.

2023 නොවැම්බර් මස 17 වැනි දින දී ය.

EOG 12 - 0275

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.